බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණය
**සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර යොමු අංකය : ඩී8/21/බ.පරි./ප්‍රාථමික දිනය : 2014.08.25

1.2 අමාත්‍යාංශය : බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය
යොමු අංකය : MPRRH/06/බන්ධ/ ප්‍රාථමික දිනය: 2016.06.06
ශිල්පීය නොවන

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/B2/48/01/Vol.II දිනය : 2013.09.24

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය :EST-2/RECRU/05/4861 දිනය : 2013.06.14

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය :NPC/6/18/096/SR-II දිනය : 2014.10.24
යොමු අංකය :NPC/6/18/096/SR-II දිනය : 2016.10.31

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය :PSC/EST/07-01-18/02/2015දිනය : 2016.07.13
දිනය :

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය නොවන

3.2 ශ්‍රේණි :III,II, I, විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතා අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහු කාර්යය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැලකේ. මෙම කාර්යය පථයන්ට අයත් කාර්යය අතුරින් ඕනෑම කාර්යය භාරයක් දෙපාර්තමේන්තු ප්‍රධාන/ පත්කිරීම් බලධරයා විසින් මෙම සේවා ගණයට පවරනු ලැබිය හැකිය.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

05. වැටුප්

5.1 වැටුප් කේත අංක : PL 1-2016

5.2 වැටුප් පරිමාණය - : 24,250 -10x250 - 10x270 - 10x300 - 12x330 - 36,410

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 24,250 /- |
| II | 12 | 27,020 /- |
| I | 22 | 29,750 /- |
| විශේෂ ශ්‍රේණිය | 32 | 32,780 /- |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| කම්කරු | III, II, I, විශේෂ ශ්‍රේණි | 35 | ප්‍රාථමික ශ්‍රේණිවලට අදාළ රාජකාරි කටයුතු |
| මුරකරු | III, II, I, විශේෂ ශ්‍රේණි | 52 | |
| වඩක | III, II, I, විශේෂ ශ්‍රේණි | 02 | එල්ලුම්ගහ ක්‍රියාත්මක කිරීම |
| වතුර පොම්ප ක්‍රියාකරු | III, II, I, විශේෂ ශ්‍රේණි | 10 | වතුර පොම්ප ක්‍රියාකරවීමට අදාළ රාජකාරි කටයුතු |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | |
|---|---|
| කම්කරු | 35 |
| මුරකරු | 52 |
| වඩක | 02 |
| වතුර පොම්ප ක්‍රියාකරු | 10 |

" ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ යන ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ."

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100 % |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙප් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) ක් සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : වතුර පොම්ප ක්‍රියාකරු

රජයේ පිළිගත් ආයතනයක විදුලි තත් ඇදීම පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.

කම්කරු/ මුරකරු/ වඩක : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : වතුර පොම්ප ක්‍රියාකරු

රජයේ පිළිගත් ආයතනයක විදුලි සහ ඩීසල් වතුර පොම්ප ක්‍රියාකරවීම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

වසරක

කම්කරු/ මුරකරු/ වඩක : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :

යහපත් චරිතයකින් යුක්ත අයවලුන් විය යුතු අතර චරිත දූෂණයට අදාල වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය. වඩක තනතුර සඳහා චිත්ත හා කායික ශක්තිය මැන බැලීම සඳහා ජාතික රෝහලේ පැවැත්වෙන පරීක්ෂණයකට ඉදිරිපත් වී එයින් සමත් විය යුතුය. අනෙකුත් තනතුරු සඳහා සෑම අපේක්ෂකයෙකුම මනා සෞඛ්‍ය තත්වයකින් හා තනතුරේ රාජකාර ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

1. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.
2. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.5 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18
7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2. වතුර පොම්ප ක්‍රියාකරු සඳහා වෘත්තීය පරීක්ෂණය:

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. ප්‍රධාන සැපයුමේ සිට විදුලිය ලබාගෙන ආරක්ෂාකාරී පියවරවල් අනුගමනය කරමින් වතුර මෝටරය සඳහා පරිපථය සකස් කිරීම<br>• අනුගමනය කරන පියවර නිවැරදි දැයි පරීක්ෂා කිරීම<br>• භාවිතා කරන උපාංග පිළිබඳ දැනුම<br>II. විදුලි/ ඩීසල් වතුර මෝටර් ක්‍රියා කරවීම පිළිබඳ හැකියාව මැන බැලීම | පැය 01 | 100 | 40% |

සටහන: වෘත්තීය පරීක්ෂණයෙන් 40% ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.2.4.2.1 පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:

| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| කාර්මික හා වෘත්තිය කුසලතා | 35 | |
| ක්‍රීඩා | 15 | |
| චරිත වර්ධනය හා නායකත්වය | 15 | |
| සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීම | 10 | |
| එකතුව | 100 | |

සටහන : 1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුලු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

3. වතුර පොම්ප ක්‍රියාකරු තනතුර සඳහා වෘත්තිය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව,පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

7.2.4.3.1 පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකි.

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද. | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර. | වාචික (ඇමුණුම 1) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර. | වාචික (ඇමුණුම 2) |
| III වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර. | වාචික (ඇමුණුම 3) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

09. භාෂා ප්‍රවීනතාවය

9.1

| භාෂාව | අනෙක් රාජ්‍ය භාෂාව |
|---|---|
| 1. භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පාටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

IV. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

V. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2.1 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1.1. **සපුරාලිය යුතු සුදුසුකම් :**

**I.** සේවා ගණයේ II ශ්‍රේණියේ වසර නවය (09)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

**II.** පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**III.** අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වසර නවය තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3.1 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1.1. **සපුරාලිය යුතු සුදුසුකම්** :

**I.** සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

**II.** උසස් කිරීමේ දිනට I ශ්‍රේණියේ වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**III.** අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**IV.** ආදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් ව තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

**සංලක්ෂය :** සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරබාහිර වන්නාවූ කොන්දේසි.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයක් ඇතුළත් නොවන , එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනයට සේවයේ යෙදී සිටින්නන් පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති PL-01-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරින් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළග ඉහල වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

(i) PL - 01 - III ශ්‍රේණිය

(අ) PL - 01 - 2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදාටක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරින්

(ආ) PL - 01-2006 - A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද, II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවශ්‍යය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරින්

PL-01-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) PL -01-II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි PL-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය(10)කට නොඅඩු එහෙත් අවුරුදු විස්ස (20) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍යය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරින්

(ආ) PL-01-2006-A වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය(09)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරින්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය(09) ක් සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරින්.

PL-01-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) PL-01-I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) කට නොඅඩු එහෙත්අවුරුදු තිහ (30) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විස්ස (20) ක් හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරින්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) කට නොඅඩු එහෙත් අවුරුදු දහනවය (19) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරින්.

(ඇ) PL-01-2006-A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය(09)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ඉහත සඳහන් සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරින්.

PL-01-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ

(iv) PL - 01 විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු තිහක(30)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක තිහ(30) ක් උපයාගෙන ඇති නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවාගැනීම් පටිපාටිය අනුව අවශ්‍ය අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙන් අවුරුදු දහනවය (19) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහනවය (19) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරින්.

(ඇ)ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය(09)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරින්.

(ඇ) PL-01-2006 - A වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණිය අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන නිලධාරින්.

PL-01 - විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටිවල දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනිමේ පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :

අත්සන : ........................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ........ සී.එස්. අමරවික්‍රම ........
පරිපාලන නිලධාරී I
තනතුර : භාණ්ඩාගාර කොමසාරිස් ජනරාල් ෙමඩහුටා
දිනය : 2017.01. 17

පරීක්ෂා කළේ :

අත්සන : ........................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ........ එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
තනතුර : ........ භාණ්ඩාගාර කොමසාරිස් (පාලන)
දිනය : 2017.01. 19
භාණ්ඩාගාර මූලස්ථානය
කොළඹ 09.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ........................................
එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : ........................................
භාණ්ඩාගාර කොමසාරිස් ජනරාල්
නිල මුද්‍රාව : ........................................
භාණ්ඩාගාර මූලස්ථානය
කොළඹ 09.

දිනය : 2017.01. 24

යොමු අංකය : MPRRH/6/2/Pri/ප්‍රාථ.ශි.නො

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි ප්‍රාථමික ශිල්පීය සේවා නොවන සේවා ගණය

තනතුර සදහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්

.......................................... අමාත්‍යාංශය

දිනය : 2017.05.04

නිල මුද්‍රාව : ඩබ්. එම්. පී. පී. වික්‍රමසිංහ
ලේකම්
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,
නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික
කටයුතු අමාත්‍යාංශය
අංක 356 B, ගාලු පාර, කොළඹ 03.

---

යොමු අංකය : PSC/EST/07-01-18/02/2015

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි ප්‍රාථමික ශිල්පීය නොවා සේවා ගණය සදහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2016.07.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2017.05.21

නිල මුද්‍රාව : එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

ඇමුණුම 01

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග පිළිබඳ ආකෘතිය</u>

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. විභාගය පිළිබඳ විස්තර

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අදාළ සේවකයා තමා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | ලකුණු 30 | 40% |
| සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | ලකුණු 30 | |
| තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණාත්මක දැනුම හා ප්‍රවීණතාවයක් ලබාගෙන ඇද්දැයි මැන බැලීම | ලකුණු 40 | |
| මුළු ලකුණු | 100 | |

3. විභාගය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්
4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්
5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| වාචික පරීක්ෂණය | 01.ආයතන සංග්‍රහයේ II,III හා XII වැනි පරිච්ඡේදයෙහි ඇතුළත් කරුණු පිළිබඳව හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති<br>02.තම රාජකාරිය මගින් සේවා ස්ථානය වෙත සපයනු ලබන සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා ලබා ඇති දැනුම හා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම |

සකස් කළේ :
අත්සන :......................................
නම :..........සී.එස්. අමරවික්‍රම..........
තනතුර :..........පරිපාලන නිලධාරි I..........
දිනය :2017.01.17 බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :
අත්සන :......................................
නම :..........එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
තනතුර :..........බන්ධනාගාර කොමසාරිස් (පාලන)
දිනය : 2017.01.19
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

අත්සන :......................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :......................................
තනතුර :..........එච්.එම්.එන්.සී. ධනසිංහ..........
දිනය : 2017.01.20 බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
නිල මුද්‍රාව :..........බන්ධනාගාර මූලස්ථානය..........
කොළඹ 09.

## කාර්යක්ෂමතා කඩඉම් විභාග පිළිබඳ ආකෘතිය

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අදාළ සේවකයා තමා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | ලකුණු 30 | 40% |
| සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | ලකුණු 30 | |
| තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණාත්මක දැනුම හා ප්‍රවීණතාවයක් ලබාගෙන ඇද්දැයි මැන බැලීම | ලකුණු 40 | |
| මුළු ලකුණු | 100 | |

3. විභාගය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| වාචික පරීක්ෂණය | 01.ආයතන සංග්‍රහයේ XVII, VII ,VIII XXII වැනි පරිච්ඡේදයන්හි ඇතුළත් කරුණු පිළිබඳව හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටිකා රීති<br>02.තම රාජකාරිය මගින් සේවා ස්ථානය වෙත සපයනු ලබන සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා ලබා ඇති දැනුම හා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම |

සකස් කළේ :
අත්සන :.......................................
නම :.........සී.එස්. අමරවික්‍රම.........
තනතුර :.........පරිපාලන නිලධාරී I.........
දිනය : 2017.01. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :
අත්සන :.......................................
නම :.........එච්.එම්.ටී.එන්. ...........
තනතුර :.........බන්ධනාගාර කොමසාරිස් (...)
දිනය : 2017.01. බන්ධනාගාර මූලස්ථාන, කොළඹ 09.

අත්සන :.......................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :.........එච්.එම්.එන්.සී. ධනසිංහ.........
තනතුර :.........බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.........
දිනය : 2017.01. බන්ධනාගාර මූලස්ථානය
නිල මුද්‍රාව :......................................... කොළඹ 09.

ඇමුණුම 03

කාර්යක්ෂමතා කඩඉම් විභාග පිළිබඳ ආකෘතිය

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන කෙටන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අදාළ සේවකයා තමා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | ලකුණු 30 | 40% |
| සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | ලකුණු 30 | |
| තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණාත්මක දැනුම හා ප්‍රවීණතාවයක් ලබාගෙන ඇද්දැයි මැන බැලීම | ලකුණු 40 | |
| මුළු ලකුණු | 100 | |

3. විභාගය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| වාචික පරීක්ෂණය | 01.ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදයෙහි ඇතුළත් කරුණු පිළිබඳව හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති<br>02.තම රාජකාරිය මගින් සේවා ස්ථානය වෙත සපයනු ලබන සේවාවන් කාර්යක්ෂම කිරීම සඳහා ලබා ඇති දැනුම හා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම |

සකස් කළේ :
අත්සන :..............................
නම :.............................. සී.එස්. අමරවික්‍රම
තනතුර :.............................. පරිපාලන නිලධාරි I
දිනය : 2017.01.... බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :
අත්සන :.............................. එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
නම :.............................. බන්ධනාගාර කොමසාරිස් (පාලන)
තනතුර :.............................. බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2017.01. 19 කොළඹ 09.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..............................
තනතුර : .............................. එච්.එම්.එන්.සී. ධනසිංහ
දිනය : 2017.01. 24 බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
නිල මුද්‍රාව : .............................. බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09,